කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ශ්‍රේණිය - 10

සකස් කළ ගුරුභවතාගේ නම - පි.ඩබ්.නිරෝෂා දමයන්ති

පාසල - ර/ ගිලීමලේ සමනල විද්‍යාලය

පාඩම - මුදල් පොත හා සුළු මුදල් පොත

1. ද්විත්ව කාර්යයක් ඉටු කරන මූලික සටහන් පොතක් වනුයේ,

    I. විකුණුම් ජ්නලය
    II. පොදු ජ්නලය
    III. ගැනුම් ජ්නලය
    IV. මුදල් පොත

2. මුදල් පොතට අදාළ මූලාශ්‍ර ලේඛන පමණක් ඇතුලත් වන්නේ,

    I. ගෙවීම් වව්චරය,බැංකු ප්‍රකාශනය
    II. ලදු පත, ගෙවීම් වව්චරය
    III. ජ්නල් වව්චරය,ගෙවීම් වව්චරය
    IV. ගැනුම් ඉන්වොයිසිය,ලදු පත

3. ගිණුම්වල සටහන් නොකරන ලද වට්ටම් වර්ගය වන්නේ,

    I. දුන් වට්ටම්
    II. වෙළඳ වට්ටම්
    III. මුදල් වට්ටම්
    IV. ලද වට්ටම්

4. පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශනය තෝරන්න

    I. මුදල් වට්ටම් භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදි ද, වෙළඳ වට්ටම් ණය බේරුම් කරන අවස්ථාවේදි ද හිමි වේ.
    II. මුදල් වට්ටම් වර්ග 4 ක් ඇත.
    III. දුන් වට්ටම් ආදායම් ගිණුමට හර කරන අතර ලද වට්ටම් වියදම් ගිණුමට බැර කරනු ලබයි.
    IV. මුදල් පොතේ හර පැත්තේ ඇති දුන් වට්ටම් තීරුවේ එකතුව , දුන් වට්ටම් ගිණුමට හර කරනු ලබයි.

5. ණයගැති පසිඳුගෙන් රු.7000 ක ණය මුදලක් සඳහා 5% ක වට්ටමක් අඩුකර මුදල් ලබා ගන්නා ලදි.මේ සඳහා අදාල ද්විත්ව සටහන වන්නේ,

I. මුදල් ගිණුම හර 6650

දුන් වට්ටම් ගිණුම හර 350

ණයගැති පසඳු ගිණුම බැර 7000

II. ණයගැති ගිණුම හර 7000

මුදල් ගිණුම බැර 7000

III. මුදල් ගිණුම හර 7000

දුන් වට්ටම් ගිණුම බැර 350

ණයගැති පසිඳු ගිණුම බැර 6650

IV. මුදල් ගිණුම හර 6650

ලද වට්ටම් ගිණුම හර 350

ණයගැති පසිඳු ගිණුම බැර 7000

6. ලක්මාල් ව්‍යාපාරය විසින් ණයහිමි බුද්ධිකට 10% ක වට්ටමකට යටත්ව රු.9000 ක මුදලක් ලබා දුනි.මේ සඳහා අදාල ද්විත්ව සටහන වන්නේ,

I. මුදල් ගිණුම හර 9000
දුන් වට්ටම් ගිණුම හර 1000

ලක්මාල් ගිණුම බැර 10 000

II. ණයහිමි බුද්ධික ගිණුම හර 9000

දුන් වට්ටම් ගිණුම හර 1000

මුදල් ගිණුම බැර 10 000

III. ණයහිමි බුද්ධික ගිණුම හර 10000

ලද වට්ටම් ගිණුම බැර 1000

මුදල් ගිණුම බැර 9000

IV. ණයහිමි බුද්ධික ගිණුම හර 10 000

දුන් වට්ටම් ගිණුම බැර 1000

මුදල් ගිණුම බැර 9000

- පහත තොරතුරු ඇසුරින් 7 හා 8 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

  2021 ජනවාරි 1 දින සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ මුදල රු.750 කි.දෙසැම්බර් මාසයේ සුළු මුදල් වියදම්වල එකතුව රු.1750කි.

7. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණද?

   I .රු.2000
   Ii. රු.1250
   Iii. රු.1750
   iv. රු.2500

8. 2020.12.31 දින ප්‍රධාන මුදල් භාරකරු ප්‍රතිපූර්ණය කල යුතු මුදල කීයද?

   I. රු.750
   II. රු.2000
   III. රු.1750
   IV. රු.2500

9. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන විට ද්විත්ව සටහන වන්නේ,

   I. අදාල වියදම් ගිණුම හර
      සුළු මුදල් පොත බැර

   II. සුළු මුදල් පොත හර

      අග්‍රිම ගිණුම බැර

   III. මුදල් පොත හර

      සුළු මුදල් පොත බැර

   IV. සුළු මුදල් පොත හර

      මුදල් පොත බැර

10. සම්පත් ගේ ව්‍යාපාරයේ 2020.04.01 දින රු.500 ක සුළු මුදල් ශේෂයක් ඉතිරි වි තිබුණි.ප්‍රධාන මුදල් භාරකරු විසින් රු. 2200 ක මුදලක් සුළු මුදල් භාරකරුට ලබා දුනි නම්, එම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණද?

    I. රු.2200
    II. රු.2700
    III. රු.150
    IV. රු.500

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 4 | 6 | 3 |
| 2 | 2 | 7 | 4 |
| 3 | 2 | 8 | 3 |
| 4 | 4 | 9 | 4 |
| 5 | 1 | 10 | 2 |

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 |  | 6 |  |

| | | | |
|---|---|---|---|
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |